Check Point Threat Extraction secured this document Get Original


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2403/53 - 2024 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ සංඛ්‍යාව ද එකී අමාත්‍යවරයන්ට විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා පැවරීම ද නිශ්චය කර ඇති හෙයින්;

විවිධ අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන ලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුර කුමාර දිසානායක,
ජනාධිපති.

2024 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 42767 — 359 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

**07. කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම<br>5. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම<br>6. ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>7. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>8. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම<br>9. කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | 1. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව<br>2. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br>3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>4. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>5. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය<br>6. ජාතික තරුණ සේවා සභාව<br>7. ජාතික යොවුන් සේනාංකය<br>8. සී/ස. ජාතික තරුණ සේවා සමූපකාරය<br>9. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය<br>10. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>11. ජාතික ක්‍රීඩා සභාව<br>12. ජාතික ක්‍රීඩා විද්‍යායතනය<br>13. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය<br>14. ක්‍රීඩා වෛද්‍ය ආයතනය<br>15. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනය | • ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34)<br>• කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත (2024 අංක 37)<br>• ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50)<br>• ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)<br>• ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)<br>• යොවුන් සේනාංක පනත (2002 අංක 21)<br>• ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)<br>• ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත (2019 අංක 24)<br>• ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා පනත (1973 අංක 25)<br>• සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනත (1999 අංක 17)<br>• ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

**07. කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 10. කාන්තා හා ළමා කටයුතුවලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම<br>11. දේශපාලන ව්‍යුහයන් තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය අවම වශයෙන් 50%ක් දක්වා ගෙන ඒමට අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති ක්‍රමිකව හඳුන්වා දීම<br>12. ආර්ථව දරිද්‍රතාව අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන , මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබා දීම.<br>13. ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩු කිරීම<br>14. ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම<br>15. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම<br>16. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම<br>17. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම<br>18. සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම<br>19. සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම<br>20. ස්ත්‍රීන්ට සහ දරුවන්ට වෙනස් කොට සලකන සහ පීඩාවට ලක්කරන විශේෂ නීති සංශෝධනය කිරීම<br>21. තරුණ පරපුරේ අභිලාෂයන් ඉටු වන ජාතික වැඩපිළිවෙලක් අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම<br>22. තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>23. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

**07. කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 24. තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු<br>25. තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලීත්වය සමාජ පිළිගැනීමක් ඇති වන හා ඔවුන්ට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකිවන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම<br>26. දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම<br>27. තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමට පියවර ගැනීම සහ ඔවුනට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම<br>28. උසස් පෙළ සමත්, නමුත් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් විය නොහැකි වූ තරුණ ප්‍රජාව ඉලක්ක කර වෘත්තීය නිපුණතාවයක් සහිත තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම<br>29. දැනටමත් මාර්ගගත ක්‍රමය ඔස්සේ විදේශ විනිමය උපයන නිදහස් වෘත්තික (Freelance) තරුණ තරුණියන්ට ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කිරීම<br>30. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>31. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම<br>32. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම<br>33. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදාගැනීමට හැකි වන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>34. ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික තරඟවලට සහභාගී වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම<br>35. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදුකිරීම | | |

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

**07. කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 36. ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේදී තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම<br>37. ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම<br>38. ක්‍රීඩා සමිති සංවිධාන සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම<br>39. ක්‍රීඩා සඳහා විශේෂ දක්ෂතා ඇති ක්‍රීඩකයන් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික මට්ටම, පෝෂණය සහ පුහුණුවට අදාළ උපකරණ ලබාදීම සඳහා පාසල් සහ දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>40. ජාතික ක්‍රීඩා පුහුණු පාසලක් කේන්ද්‍රකොට ගනිමින් පළාත් නවය සඳහාම නවීන ක්‍රීඩා පාසල් ජාලයක් ඇති කිරීම<br>41. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>42. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |